
# ඉමී සහ බිලී



තුල්මි චමත්කාරා ලියනගේ

# ඉමී සහ බිලී

තුල්මි චමත්කාරා ලියනගේ

**“ඉමී සහ බිලී”**

කර්තෘ ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2023 ඔක්තෝබර්

ISBN 978-624-206-927-2

කතාව සහ චිත්‍ර

තුල්මි චමත්කාරා ලියනගේ

2 ශ්‍රේණිය

මහාමායා බාලිකා විදුහල

කතුවරියගේ තවත් කෘති

**අකීකරු මල්ලී - 2023**

# පිදුම

කතන්දර පොත ලිවීමට

මා උනන්දු කරවූ

චාමිනි පල්ලියගුරු ගුරු මැණියන්ටත්

මාගේ ආදරණීය

අම්මාටත්, තාත්තාටත්

පුදකරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20

එකමත් එක කැලයක ඉමී කියලා ඉබ්බෙක් හිටියා. ඒ ඉබ්බාට බිලී කියලා යාළුවෙක් හිටියා. එයා බල්ලෙක්.



මේ බිලී හරිම නපුරුයි.
හැමෝටම කරදර කරනවා.
ඒ නිසා හැමෝම එයාට
කැමති නැහැ.



ඉමී හිතුවා බිලීට කාටවත්
කරදර කරන්න හොඳ නැහැ
කියලා තේරුම් කරලා
දෙන්න. ඒත් එයාගේ හිත
රිදෙයි කියලා ඉමී, බිලීට
ඒක කිවුවේ නැහැ.

දවසක් බිලීගේ වත්තට ආපු කුරුළු රංචුවකට කෑම කන්න නොදී බිලී, බුරලා බුරලා එයාලව පන්නා දැම්මා.



ඉවසලා ඇති කියලා හිතලා

එක දවසක් ඉමී, "ඔයා

හැමෝටම කරදර කරන

නිසා ඔයාට කවුරුත් කැමති

නැතිවෙයි. ආදරෙත් නැති

වෙයි කියලා කිවුවා.

ඒක අහලා බිලීට දුක

හිතිලා ගෙදර දිවුවා. ගෙදර

ගිහින් වුන දේ එයාගේ

නංගීට කිවුවා.



නංගී ඉමී හම්බවෙන්න ආවා. "ඇයි අපේ අක්කාගේ හිත රිද්දුවේ?" කියලා ඉමීගෙන් ඇහුවා.



"බිලී ගේ වැඩ නිසා එයාට
කවුරුත් ආදරෙත් නැතිවෙයි
කියලා හිතලා එහෙම කිවුවේ"
ඉමී කිවුවා. කුරුල්ලෝ කෑම
කාලා ආපහු යනවනෙ. එයාලා
කුරුලු ලෑල්ලේ කෑමනේ
කන්නෙ. ඉමී විස්තර කළා.
නංගී ගෙදර ගිහින් බිලීට
තේරුම් කරලා දුන්නා .

ඊට පස්සේ බිලී, ඉමී හම්බවෙන්න ඇවිත් "මම ආයෙමත් නපුරු කෙනෙක් වෙන්නේ නැහැ" කියලා කිව්වා.

එයාගේ වැරදි කියලා දුන්නට බිලී, ඉමීට ස්තුති කළා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20

ISBN 978-624-206-927-2